IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2013

**(ප්‍රථම සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2014 සැප්තැම්බර්/ ඔක්තෝබර්)**

## BLE 103 - ලේඛකත්වය හා සන්නිවේදනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමි වේ.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න දහයකින් (10) සහ පිටු එකකින් (01) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

I - කොටස

1. මානව සන්නිවේදනයේ සංවර්ධනය පිළිබඳව සැලකීමේ දී මුද්‍රණ යුගය වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

2. "භාෂණය හා ලේඛනය වශයෙන් ස්වරූප දෙකක් ව්‍යවහාර වීම භාෂා ද්විරූපතාවේ ලක්ෂණයකි." සිංහල භාෂාව ඇසුරින් විමසන්න.

3. <u>එක්කෝ</u>

පුවත්පත් බස් වහරේ දැකිය හැකි ප්‍රභේද කවරේදැයි දක්වා, එයින් එක් ප්‍රභේදයක් පිළිබඳව විමර්ශනයක් කරන්න.

<u>නැතහොත්</u>

ශ්‍රව්‍ය විද්‍යුත් මාධ්‍යයට ලිවීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු කවරේදැයි පැහැදිලි කරන්න.

4. "භාෂාව විශේෂ ආකාරයකින් යොදා ගැනීමට දැන්වීම්කරුවාට සිදුවේ." නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

5. පහත සඳහන් මාතෘකාවලින් <u>02ක්</u> පිළිබඳව සවිස්තරාත්මක සටහන් ලියන්න.

   i. මානව භාෂාවේ මූලික ගුණාංග
   ii. වාච්‍ය හා අවාච්‍ය සන්නිවේදනය
   iii. පුද්ගලාන්තර සන්නිවේදනය
   iv. ජනසන්නිවේදන යුගය

II - කොටස

6. සිංහල අක්ෂර මාලාවේ ප්‍රතිසංස්කරණ ඇති වීමට බලපෑ හේතු පැහැදිලි කරන්න.

7. i. සිංහල අක්ෂර වින්‍යාසයේ ගැටලු ඇතිවන අංශ කවරේද?
   ii. සිංහල අක්ෂර වින්‍යාසයේ 'පොදු වැරදි' 10ක් දක්වා ඒවායේ නිවැරදි රූප දක්වන්න.

8. 'ශාස්ත්‍රීය ලේඛනය' අනෙකුත් ලේඛන ප්‍රභේදවලින් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

9. 'ශාස්ත්‍රීය ලේඛන ක්‍රියාවලිය' යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකාවලින් <u>02ක්</u> පිළිබඳව සවිස්තරාත්මක සටහන් ලියන්න.

   i. අමිශ්‍ර සිංහල හෝඩිය
   ii. උද්ධෘත භාවිතය
   iii. පිටුඅග සටහන් දැක්වීම (Footnotes)
   iv. පිටපත් සංස්කරණය (Copy Editing)